**ශීර්ෂය 411- නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබදව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 නොවැම්බර් 10 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා  ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට  නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ  වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය  විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා  සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික

විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) මූලධන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (i) | අමාත්‍යාංශය විසින්, වෙනත් මූලධන වියදම් යටතේ ඇති යටිතල පහසුකම් සංවර්ධන වැයවිෂයය (2506) යටතේ 2021 වර්ෂය තුල රු.මි.8,280.18 ක් සංවර්ධන කටයුතු සඳහා වැයකර තිබුණි. නමුත් එම ප්‍රාග්ධන වියදම දැරීම තුලින් පැන නැගුණු වත්කම් හෝ කෙරීගෙන යන වැඩ පිළිබඳව ගිණුම් ප්‍රකාශන තුල හෙළිදරව් කර නොතිබුණි. | මූලධන වියදම් තුලින් පැන නගින වත්කම් හෝ කෙරීගෙන යන වැඩ කොපමණද යන්න හඳුනාගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් හඳුන්වා දී ඇති ගිණුම්කරණ පද්ධතිය තුලින් හෙළිදරව් කිරීමේ පහසුකම් මේ දක්වා සපයා නොමැති අතර දැනට ක්‍රියාත්මක වන ගිණුම් ක්‍රමවේදයට අනුව අදාල හෙළිදරව් කිරීම් ගිණුම්වල සිදුකර ඇත. | මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතු බව. |
| (ii) | අමාත්‍යාංශයේ යටිතල පහසුකම් සංවර්ධනය යටතේ සිදුකරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් අමාත්‍යාංශයේ විවිධ අංශ යටතේ ක්‍රියාත්මක කරන අතර එම වැඩ ආරම්භ කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ලබාදෙන වැඩ ආරම්භ කිරිමේ අත්තිකාරම් මුදල් ගෙවීම් සෘජුවම එක් එක් උප වැය විෂයයන්ට හර කරන බව නිරීක්ෂණය විය. එබැවින් 2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක උප සංවර්ධන ව්‍යාපෘති 50 ක් සඳහා ලබාදෙන ලද වැඩ ආරම්භ කිරිමේ අත්තිකාරම් රු.මි.848.32 න් 2021 දෙසැම්බර් 31 දිනට අයනොවූ රු.මි.649.97 මූල්‍ය ප්‍රකාශයේ ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම් ගතවී තිබුණි. මෙම මුදල වෙනම හඳුනාගත හැකි පරිදි කොන්ත්‍රාත් ගෙවීම් ලේඛනය පවත්වා නොතිබුණි. | අත්තිකාරම් ඇපකර ලබාගෙන ගෙවීම් කරන ලද අවස්ථාවේම අදාල වැය විෂයේ වියදමක් හැටියට ගිණුම්ගත කර, වර්ෂයකට වඩා ක්‍රියාත්මක වන ව්‍යාපෘති වලින් ගිණුම් වර්ෂය අවසන් වන විට නොපියවූ අත්තිකාරම් ගිණුම් වාර්තාවල පෙන්වීම සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රධාන ලෙජරයේ ලෙජර් ගිණුම්වල වෙනම ලැබිය යුතු මුදලක් වශයෙන් ගිණුම්ගත කිරීමේ පහසුකම් දැනට පවතින ගිණුම් ක්‍රමවේදයට අනුව ගැලපීම් කිරීමේ හැකියාවක් නොමැති බව පෙන්වා දීමට කැමැත්තෙමි. | මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අමාත්‍යාංශයේ වාහන ලැයිස්තුව අනුව අමාත්‍යාංශය සතු වාහන 19 ක් පැවති අතර ඒවායෙහි තක්සේරු වටිනාකම වන රු.මි.153.57 ගිණුම්ගත කිරීමේදී රු.මි.4.5 ක් අඩුවෙන් සටහන් කර තිබුණු බව නිරීක්ෂණය විය | අමාත්‍යාංශය සතු වාහනවල 2021 තක්සේරු වටිනාකමට අනුව රු. මි. 4 ක් ලෙස දක්වා තිබූ වාහනය රු. මි. 7 ක් ලෙස තක්සේරු කර ඇත. එම වාහනය වත්කම් ලෙස ඇතුලත් කරන ලද්දේ 2017 වර්ෂයේ බැවින් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අංක 04/2018 හා 2018 දෙසැම්බර් 31 දරණ වත්කම් චක්‍රලේඛය පරිදි, වාහන තක්සේරු කිරීම අවුරුදු පහෙන් පහට සිදුකල යුතු ලෙස ලබාදී ඇති උපදෙස්වලට අනුකූල වෙමින් බව පෙන්වාදීමට කැමැත්තෙමි. | වත්කම් වල එකතුව මූල්‍ය ප්‍රකාශන තුල නිවරදිව දැක්විය යුතුය. |

**(ඇ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.මි.** | **අනුකූල නොවීම** | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br><br>මු.රෙ 104(4) | 1.05 | වාහන 03 කට සිදුවූ අනතුරු සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව අවසන් පරීක්ෂණ පවත්වා වගකිවයුත්තන් නිශ්චය කර නොතිබුණු අතර එක් වාහනයක් 2021 සැප්තැම්බර් 21 දින අනතුරු සිදුවී තිබුණු නමුත් සිදු වුණු අලාභය තක්සේරු කර එම අලාභය පියවා ගැනීමට අනතුර සිදුවී මාස 08 ක් ගත වුවද කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේදී රටෙහි පැවති කොවිඩ් වසංගත තත්වය හා නිරෝධානය ඇඳිරිනීති තත්වය නිසා රක්ෂණ ආයතන මඟින් ගෙවීම් සිදු කිරීම හා අලුත්වැඩියාවන් සිදු කිරීම ප්‍රමාද විය. රක්ෂණ ආයතන මඟින් ගෙවීම් සිදු කිරීමෙන් පසුව මු.රෙ. 104(4) පරීක්ෂණය සිදුකළ යුතුය. අනතුරු තුනෙහි මු.රෙ. 104(4) යටතේ පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීම ප්‍රමාද විය. මෙම පරීක්ෂණයන්ට අදාලව පත්කර ඇති කමිටු මු.රෙ. 104(4) පරීක්ෂණ සිදු කර වාර්තා ඉදිරිපත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරිම,ප්‍රතිපාදන මාරු කිරීම, පරිපූරක අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ලබා ගැනීම හා උපයෝජනය, ප්‍රතිපාදන උපයෝජනය කිරීම, ඉතිරිවීම් සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දක්වා ඇත.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මු.රේ.66 යටතේ වැය විෂයයන් 03ක් සඳහා මාරුකර තිබූ රු.මි.718.5 ක සම්පූර්ණ මුදලම ඉතිරි වී තිබුණි. | වැය විෂයන් සඳහා, වියදම් සඳහා කරන ලද පුරෝකථනය මත මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන ඇතිකර ගත්තත් අපේක්ෂිත වියදම් පැන නොනැගීම මත ප්‍රතිපාදන ඉතිරි වී ඇති අතර, 411-02-03-03-2506 වැය විෂය සඳහා රු.මි.757.42ක බිල්පත් ලැබී තිබුණත් අක්මුදල් නොලැබීම මත බිල්පත් ගෙවීමට නොහැකිව ප්‍රතිපාදන ඉතිරිවිය. | ඇස්තමේන්තු සකස් කිරීමේදී තාත්විකව ගණනය කල යුතු අතර අක්මුදල් ඉල්ලුම් කිරීම නියමිත කාලය තුල සිදුකල යුතු බව. |
| (ආ) | පුනරාවර්ථන වැයවිෂයයන් 07 ක් යටතේ ප්‍රතිපාදනය කර තිබුණු රු.මි.7.06 ක සහ ප්‍රාග්ධන වැය විෂයයන් 16 ක් යටතේ ප්‍රතිපාදනය කර තිබුණු රු.මි.12.50 ක මුදලින්, එක් එක් වැය විෂයයේ ප්‍රතිපාදන වලින් 20% ත් 96% ත් අතර පරාසයක වන ලෙස පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් එකතුව රු.මි.2.83 ක් හා ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් එකතුව රු.මි.3,605.04 ක් වන ලෙස සමස්ථ ඉතිරිය රු.මි.3,607.87 ක් වී තිබුණි. | නිරීක්ෂණ හා එකග වන අතර අපගේ ගිණුම් වාර්තාවල දක්වා ඇති පරිදි ප්‍රධාන වැය විෂයන් ගණනාවක ප්‍රතිපාදන ඉතිරිවී ඇත්තේ බිල්පත් ගෙවීම් කිරීමට ප්‍රමාණවත් අක්මුදල් නොලැබීමේ හේතුව මත බව පෙන්වාදීමට කැමැත්තෙමි. | ඇස්තමේන්තු සකස් කිරීමේදී තාත්විකව ගණනය කල යුතු අතර අක්මුදල් ඉල්ලුම් කිරීම නියමිත කාලය තුල සිදුකල යුතු බව. |

### 2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | අමාත්‍යාංශය අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.9 ඡේදය ප්‍රකාරව විගණන විමසුමකට දින 166 ක් ඉක්මවා තිබියදී පිළිතුරු ලබා දිමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

අනාවරණය වූ විගණන නිරික්ෂණ පහත දක්වා ඇත.

| | විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 09 දිනැති අංක D/UD/UDA/2021/005 දරන ලිපියෙන් හා 2021 නොවැම්බර් 16 දිනැති අංක TCDP/PRDA/W/01A දරන ලිපියෙන් පිටිපන තලගල අදියර 1 මාර්ගය සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුව අවසන් කිරිමට තීරණය කර තිබුණි. උක්ත ව්‍යාපෘතියට අදාලව නිරවුල් නොකරන ලද රු.මි.114.08 ක වැඩ අත්තිකාරම් මුදල කාර්යසාධන බැඳුම්කරය මගින් ලබාගැනීමට එම කොන්ත්‍රාත්කරුගේ බැංකුව වෙතින් 2022 සැප්තැම්බර් 15 වන දින ඉල්ලීම් කර ඇති නමුත් 2022 සැප්තැම්බර් 27 දින වාණිජ ඉහළ උසාවිය මගින් ලද නියෝගය අනුව බැංකුව විසින් ගෙවීම ප්‍රතික්ෂේප කරන බව සැප්තැම්බර් 27 දිනම දන්වා තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | අත්තිකාරම් මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කල යුතු බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වන හෝමාගම හයිලෙවල් මාර්ගයේ සිට කටුවාන හංදිය දක්වා නව ප්‍රවේශ මාර්ගය හයිලෙවල් මාර්ගය හා සම්බන්ධ කිරිමට කොන්ත්‍රාත්තුව රු.මිලියන 713 කට ප්‍රදානය කර තිබුණි. වැඩ ආරම්භ කර වර්ෂ 3 | පිළිතුරු ලබා දී නොතිබුණි. | ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීම අනතුරුව |

| | | |
|---|---|---|
| කට අධික කාලයක් ගත වී ඇතත් ඉඩම් කැබලි දෙකක ඉඩම් පවරා ගැනීම හා වන්දි මුදල තක්සේරු නොකිරීම නිසා මීටර් 50 ක පමණ වූ දුර ප්‍රමාණයක මාර්ග සංවර්ධන කටයුතු 2022 පෙබරවාරි 28 දින සිට නතර කර තිබුණි. 2022 අප්‍රේල් 19 දින මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මෙම මාර්ගය පවරා තිබුණු නමුත් එම මාර්ගයේ ඉදිකිරීම් සඳහා රු.මි.540.83 ක් වැය කර තිබුනද ප්‍රධාන මාර්ගය හා සමබන්ධ කිරීමට එම නිම නොකල මීටර් 50 ක් වූ දුර ප්‍රමාණය හේතුවෙන් මාර්ගය මහජන උපයෝජනය සඳහා යොදා ගැනීමට නොහැකි වී තිබුණි. | | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 (ආ) වගන්තිය අනුව කටයුතු කල යුතුය. |

## 3.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| බස්නාහිර පළාත් ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රවාහන පද්ධතිය සඳහා යෝජිතව තිබූ සැහැල්ලු දුම්රිය ධාවනපථ 04 න් 03ක් පෞද්ගලික රාජ්‍ය හා හවුල්කාර (PPP) පදනම මත සිදු කිරීමට සැලසුම් කර තිබුණි. ප්‍රවාහන පද්ධතිය පිළිබඳව 2017 වර්ෂයේ සක්‍යතා අධ්‍යයනයක්, පාරිසරික බලපෑම පිළිබඳ ඇගයීමක් හා සමාජීය බලපෑම පිළිබඳ ඇගයීමක් සඳහා රු.මි. 453.58 ක් වැය කර තිබුණි. කැබිනට් අනුමැතිය අනුව අමාත්‍ය මණ්ඩලය ප්‍රසම්පාදන කමිටුව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස ආයෝජිකයින්ගෙන් අයදුම්පත්‍ර කැඳවා යෝජනා ඉදිරිපත් කිරීමට මාස 6ක කාලයක් ලබා දී තිබුණි. ඉදිරිපත් වූ ආයෝජකයන් 17 දෙනෙකුගේ ඇගයීම් කටයුතු විදේශ උපදේශන සමාගමකට ලබාදී රු. මිලියන 45.16 ක් ගෙවා තිබුණි. නමුත් රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත මෙම ව්‍යාපෘතිය නවතා දමා තිබූ අතර මෙම ව්‍යාපෘති කාර්යාලය 2022 මැයි 31 දින වසා දමා තිබුණි. ව්යාපෘති කාර්යාලය සඳහා 2017 වර්ෂයේ සිට 2020 ඔක්තොම්බර් මස දක්වා රු. මිලියන 196.65 ක් මෙම අමාත්‍යාංශයෙන් වැය කර තිබුණි. ඒ අනුව එකතුව රු.මිලියන 695. 39 ක් වූ වියදම් නිර්කායීය වී තිබුණි. | පිළිතුරු ලබා දීමට කල් ඉල්ලා තිබුණි. | ව්‍යාපෘති සැලසුම් කර පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 3.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පිටිපන තලගල අදියර 1 මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම උදෙසා හිමිකම් කියනු ලබන පාර්ශවයන් වෙත වන්දි ගෙවීමේ වටිනාකම තක්සේරු කිරීමකින් තොරව කොන්ත්‍රාත්කරුට 2018 ඔක්තෝබර් 26 දින රු.මි.562.87 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ අතර 2019 මාර්තු 06 සහ 2020 නොවැම්බර් 27 දින එකතුව රු.මි.114.08 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණි. වසර 4 කට ආසන්න කාලයක් ගත වුවද ඉඩම් අත්පත් කරගැනීම හා වන්දි ගෙවීම සඳහා ක්‍රියා පටිපාටියක් අනුගමනය නොකිරීම නිසා ප්‍රදේශවාසීන්ගෙන් ඇති වී තිබූ විරෝධතාවයක් මත කොන්ත්‍රාත් කටයුතු සිදු කිරීමට නොහැකි තත්වයක් මත ව්‍යාපෘතිය අවසන්කර තිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීමෙන් අනතුරුව කොන්ත්‍රාත් ලබාදීම පිළිබඳ ප්‍රසම්පාදන කටයුතු කළ යුතු බව. (ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 (ආ) වගන්තිය අනුව) |

## 3.4 වෙනත් නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහකොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය යටතේ දියවන්නා ඔය පුළුල් කිරීම සඳහා ඉඩම් පවරා ගැනීමේදී වන්දි ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් පවරාගෙන තිබුණු එක් ඉඩමකට හිමිකම් කියූ විදේශීය සමාගමක් විසින් අන්තර් ජාතික ආයෝජන ආරවුල් සමථ කිරීමේ මධ්‍යස්ථානය වෙත ශ්‍රී ලංකා රජයට එරෙහිව 2016 ජූලි 07 දින නඩු පවරා තිබුණි. ගොනුකල නඩුව සඳහා විදේශ නීති උපදේශකයන්ගේ සහාය ලබාගැනීම වෙනුවෙන් සහ ඒ වෙනුවෙන් පෙනී සිටි නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ විදේශ ගමන් වියදම් ද ඇතුළුව මුළු වියදම රු.මි.405 ක් වූ අතර මෙම වටිනාකම තුල ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.මි. 25.58 ක් ද ඇත. 2020 මාර්තු 05 හා 2020 දෙසැම්බර් 02 දිනැති නඩු තීන්දු අනුව විදේශීය සමාගම විසින් ශ්‍රී ලංකා රජයට පවුම් 387,162.34 ක් ගෙවිය යුතුව තිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු බව . |

විදේශීය සමාගම මෙම මුදල නොගෙවීම හේතු කොට ගෙන එම මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග 2022 ඔක්තෝබර් 31 දින දක්වා අමාත්‍යාංශය ගෙන නොතිබුණි.

**3.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ අමාත්‍යාංශය විසින් රු.මි.2,000 ප්‍රතිපාදන මගින් ඇවිදින මංතීරු 30ක් සැදීමට සැලසුම් කර තිබූ අතර ඉන් මංතීරු 3ක් 2022 ජූනි 30 දිනට අවසන් කල යුතු අතර ඉතිරි සියළුම මංතීරු 2021 දෙසැම්බර් 31 වන විට අවසන් විය යුතු වුවත් මංතීරු 4 ක වැඩ පමණක් අවසන් කර තිබූ අතර මංතීරු 3ක වැඩ අත්හිටුවා තිබුණි. ඉතිරි මංතීරු 23හිම 2021 දෙසැම්බර් 31 දිනට ඉලක්ක ගත ප්‍රගතිය කරා ලඟා වී නොතිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට මේ සඳහා රු.මි.1,385 ක් වැය කර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | සැලසුම් කල පරිදි ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් නවය තුල ක්‍රියාත්මක කරනු ලබන නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂයේ රු.මි.3,423 ක් වෙන් කර තිබූ අතර ඒ යටතේ උප ව්‍යාපෘති 57ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට රු.මි.2,122 ක් වැය කර උප ව්‍යාපෘති 52 ක් ක්‍රියාත්මක කර තිබූ අතර එම ව්‍යාපෘතීන්හි ප්‍රගතිය පහත පරිදි විය.<br>i. මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කය තුල ව්‍යාපෘති 09ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුනද ඉන් ව්‍යාපෘති 03ක් ක්‍රියාත්මක කර නොතිබූ අතර ඉතිරි ව්‍යාපෘති 6න් 3ක ප්‍රගතිය 10% ත් 23% ත් අතර විය.<br>ii. ක්‍රියාත්මක කල ව්‍යාපෘති 11 ක් අතරින් 2021 දෙසැම්බර් 31 දිනට භෞතික ඉලක්ක සපුරාගෙන නොමැති නමුත් මුල්‍ය ඉලක්ක අභිබවා මුදල් ගෙවා තිබූ ව්‍යාපෘති 4ක් වූ අතර භෞතික ප්‍රගතිය 100% ක් සපුරා තිබූ නමුත් මුදල් කිසිවක් ගෙවා නොතිබූ ව්‍යාපෘති 7 ක් විය. | පිළිතුරු ලබා දී නොමැත. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |

## 3.6 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය** | | |
| (i) | ව්‍යාපෘතියේ වසර අවසානය දක්වා භාරදීමට නියමිතව තිබූ උපදේශන වාර්තා 16 න් වාර්තා 11 ක් පමණක් උපදේශකයින් විසින් ලබා දී ඇති අතර ලැබුණු වාර්තා අතරින් ව්‍යාපෘතිය විසින් සමාලෝචනය කර තිබුණේ වාර්තා 7 ක් පමණි. ඉන් 3ක් සමාලෝචනයෙන් පසු ව්‍යාපෘතිය විසින් පිළිගෙන නොතිබුණි. උපදේශන ගිවිසුම් අනුව ප්‍රමාද වූ වාර්තා 5න් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට අදාල ප්‍රතිපාදන ගිවිසුමේ ඇතුළත් කර නොතිබුණි. | සැලැස්මට අනුව උපදේශක කණ්ඩායම වැඩ ආරම්භ කර නොතිබුණි. | උපදේශන කටයුතු සඳහා ගෙවීම් කිරීමට පෙර ඒවා නිවැරදිව අධීක්ෂණය කළ යුතු අතර ගිවිසුම්වලට අවශ්‍ය ප්‍රතිපාදන ඇතුළත් කළ යුතුය. |
| (ii) | ජනාධිපති ලේකම්වරයාගේ 2020 සැප්තැම්බර් 21 දිනැති ලිපියෙන් ව්‍යාපෘතියේ ඵලදායිතාවයේ අධික පිරිවැය සහ මහ කොළඹ නාගරික ප්‍රදේශයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘතියේ නුසුදුසු බව වැනි හේතු ඉදිරිපත් කරමින් නිකුත් කල නියෝගයට අනුව ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්වරයා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරමින් සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය අත්හිටුවන ලෙස ඉල්ලා තිබුණි. අනතුරුව 2020 සැප්තැම්බර් 28 දිනැති අංක 20/1450/312/002 දරන කැබිනට් තීරණය මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම්වරයාට ව්‍යාපෘතිය අත්හිටුවීමට සහ ව්‍යාපෘති කාර්යාලය වසා දැමීමට කැබිනට් මණ්ඩලය නියෝග කර ඇත. නමුත් ගිවිසුම් ගතව ආරම්භ කල ව්‍යාපෘතිය අවසන් කිරීමට සන්දේශය ඉදිරිපත් කිරීමට ප්‍රථම මේ සම්බන්ධයෙන් නීතිපතිගේ නිරීක්ෂණ ලබාගැනීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නොතිබුණි | ව්‍යාපෘතිය අවසන් කිරීමට පෙර විධිමත් විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් සිදු කළ යුතු බව. |
| (iii) | සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය සඳහා රු.මි.4,418.32ක් වැයකර උපදේශන වාර්තා සකසා තිබියදී ජනාධිපති ලේකම්වරයා විසින් නිකුත් කරන ලද ලිපියට අනුව නැවත නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගෙන සුදුසු විකල්ප ක්‍රියා පටිපාටියක් | පිළිතුරු ලබාදී නොතිබුණි | උපදේශන වාර්තා, ඵල රහිත නොවී භාවිත කිරීමට විකල්ප ක්‍රියා පටිපාටියක් හඳුන්වා දිය |

| | | | |
|---|---|---|---|
| | ස්ථාපිත කරන ලෙස දැනුම් දී ඇත. එම නියෝගය මත 2021 මාර්තු 16 වන දින නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් මහජන පුද්ගලික සහභාගීත්වයෙන් යුත් ව්‍යාපෘතියක් ලෙස "මෙට්‍රෝ දුම්රිය ජාල පද්ධතිය" (Metro Railway Network system) නමින් නව ව්‍යාපෘති යෝජනාවක් යෝජනා කර ඇත. කෙසේ වෙතත් 2021 අප්‍රේල් 06 වැනි දින කැබිනට් තීරණ අංක 21/0510/306/035 හරහා ලබා දුන් කැබිනට් නියෝගයට අනුව එම ව්‍යාපෘති යෝජනාවද ඉල්ලා අස්කරගෙන ඇත. | | යුතුය. |
| **(iv)** | මෙම ව්‍යාපෘතිය සඳහා හෙක්ටයාර 21 ක පමණ ඩිපෝ ඉදිකිරීමට අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 10.1 වගන්තිය අනුව කටයුතු කර තිබුණද 2020 වසර අවසානයේ දී ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමෙන් පසු 2022 අගෝස්තු දක්වාම ඉඩම් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | ඉඩම් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කලයුතු වේ. |
| **(v)** | පසුගිය වසරේ සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අවසන් කිරීම හේතුවෙන් උපදේශන සමාගමට ලැබිය යුතු ඇ.ඩො.මිලියන23.65 ද ඇතුළුව ඇ.ඩො.මිලියන31.36 ක අලාභයක් ඉල්ලා තිබුණි. ඒ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා 2021 පෙබරවාරි 15 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් කමිටුවක් පත් කර තිබුණි. මෙම කමිටුව විසින් වසර 1 ½ක පමණ කාලයක් ගත කිරීමෙන් අනතුරුව 2022 ඔක්තෝම්බර් 26 දින අමාත්‍ය මණ්ඩලයට වාර්තාවක් ඉදිරිපත් කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල තීරණයක් 2022 නොවැම්බර් 10 දින වන විටත් ලැබී නොතිබුණි. මෙසේ තීරණ ගැනීමට වන ප්‍රමාදයන් හේතුවෙන්, කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසිය අංක 6.6 අනුව ප්‍රමාද වූ කාලය සඳහා පොලී ගෙවීමට සිදු විය හැකි බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නොතිබුණි. | පත්කළ කමිටුව විසින් මේ ගැන වහාම සාකච්ඡා කර තීරණයකට එළඹිය යුතුය. |
| **(vi)** | පෙර වසරේ සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය අත්හිටුවීමට ගත් තීරණය හේතුවෙන්, 2019 මැයි 23 දින අත්සන් කරන ලද ණය ගිවිසුමට අනුව පෙර අවසන් ගාස්තුව **(Front End Fee)** ලෙස ගෙවා තිබූ සියයට 0.2ක් එනම් යෙන් මිලියන 60.08 ට සමාන රු.මි.102.73 ක මුදලක් නිෂ්ඵල වියදම් බවට පත් වී තිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | ව්‍යාපෘති අවසන් කිරීමට තීරණය කිරීමේදී මෙම පිරිවැය පිළිබඳවද සළකා බැලිය යුතු බව |
| **(vii)** | සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය පෙර වසර අවසානයේ සිට අත්හිටුවා තිබුණද, මාලඹේ සිට බත්තරමුල්ලට මාරු වන උපයෝගිතා මාර්ගය සඳහා ද්‍රව්‍ය සැකසීම ආරම්භ කිරීම සඳහා ලංකා විදුලිබල | පිළිතුරු ලබාදී නොතිබුණි | අත්තිකාරම් මුදල් අයකර ගැනීමට නිවැරදි ක්‍රියාමාර්ග ගත |

| | | |
|---|---|---|
| මණ්ඩලයට ලබා දී ඇති වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල රු.මි.36.01ක් සහ කොළඹ නගරය තුළ භූගත උපයෝගිතා මාර්ග මාරු කිරීම සහ භූගත කේබල් ඇදීම සඳහා රු.මි. 8.09ක් 2022 මැයි මාසය වනතුරුත් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | යුතුය |

## 3.7 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 14/1030/503/087 හා 2014/08/01 දින නිකුත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව සනීපාරක්ෂක බිම් පිරවුම් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට හා දෛනිකව එකතු වන නාගරික අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 1200 බැහැර කිරීමට 2015-2016 කාලය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා 2014 සැප්තැම්බර් 05 දින කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා දී රු.මි. 14,017 ක් මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබියදී, අදාළ ව්‍යාපෘතිය නිසි ලෙස ක්‍රියාත්මක නොකිරීමෙන් 2017 අප්‍රේල් 14 දින මීතොටමුල්ල කසළ කන්ද නාය යෑමෙන් ජීවිත 32ක් අහිමි වීම සඳහා හේතු වී තිබූ බව අනාවරණ විය. පසුව ඒ සඳහා අරුවක්කාලු සනීපාරක්ෂක කසල රැඳවුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. | අදාළ ව්‍යාපෘතිය විල්පත්තු ජාතික උද්‍යානයේ ස්වාරක්ෂණ කලාපය තුල තිබීම හේතුවෙන් පාරිසරික ඇගයීම් වාර්ථාව සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් අනුමැතිය නොලැබිණ. මෙම හේතුව මත එම ව්‍යාපෘතිය එම කාලය තුල ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | ව්‍යාපෘතිය සැලසුම් කල කාලරාමුව තුල ආරම්භ කිරීමට පියවර ගත යුතුය. මහජනතාවට සිදුවන අපහසුතා වලක්වා ගැනීමට අවශ්‍ය පියවර ගතයුතුව තිබුණි. |
| (ආ) | **අරුවක්කාලු සනීපාරක්ෂක කසල රැඳවුම් ව්‍යාපෘතිය** | | |
| (i) | මෙම ව්‍යාපෘතිය කඩිනමින් නිමකල යුතු බවට හේතු දක්වා ලෝක බැංකුව විසින් එකගවූ ඇමරිකන් ඩොලර් 700,000 ක ලෝක බැංකු ආධාරද අහිමිකරගනිමින් දේශීය අරමුදලින් ක්‍රියාත්මක කිරීමට ලබාදී තිබූ කොන්ත්‍රාත්තුවේ සම්පූර්ණ ඇස්තමේන්තුගත මුදල ඇ.ඩො. මිලියන 120 වන අතර එහි දේශීය අගය රු.මිලියන 19,127 කි. මෙය 2018 ජනවාරි 01 දින ආරම්භ කර 2019 ජුනි 30 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබූ නමුත් 2021 දෙසැම්බර් 31 වන විට මෙම ව්‍යාපෘතිය සඳහා රු මිලියන 18,345.02ක් වැයකර තිබුණි. වසර 02ක් ප්‍රමාදවී | 2019 වසර තුල මහජන විරෝධය මධ්‍යයේ ව්‍යාපෘතියේ සැලසුම් හා ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. රට වසා දැමීමත්, පැවති සෞඛ්‍ය නීතිමය තත්ත්වය හමුවේ කොන්ත්‍රාත්කරුට සිය ඉදිකිරීම් කටයුතු අවසන් කල නොහැකි විය. මෙ අතර 2021 නොවැම්බර් 8 වන දින අරුවක්කාලු ව්‍යාපෘති භූමිය | ව්‍යාපෘතිය නිමකිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබියදී ව්‍යාපෘති කාලසීමාව 2022 ජුලි 31 දක්වා දීර්ඝ කර එදින දක්වා ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මි. 18,601.49 ක් වැය කර තිබුණු අතර රු.මි. 4.494.61 ක් බිල්පත් සඳහා 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව පවති, නිමකල යුතු දින ඉක්මවා වසර 02ක් ගත වුවද අදාල ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට නොහැකි වී තිබුණි. | ජලයෙන් යටවීම හා කොන්ත්‍රාත්කරුගේ බිල්පත් ගෙවීම විශාල ලෙස ප්‍රමාද කිරීම, රටතුල වූ ආර්ථික තත්ත්වය සහ විදුලි කප්පාදුව කොන්ත්‍රාත්කරුගේ ඉදිකිරීම් කටයුතු විශේෂයෙන් යන්ත්‍රෝපකරණ සවි කිරීම, මෙහෙයුම් කටයුතු සිදු කිරීම ආදී සියල්ල අඩපණ වීමට හේතු විය. කෙසේ වෙතත් මේ වන විට මුළු ව්‍යාපෘතියේ 87% කට වැඩි භෞතික ප්‍රගතියක් ලබාගෙන ඇත. | |
| (ii) | දුම්රිය එන්ජින් කට්ටල 04 ක් 2019 දෙසැම්බර් 31 දින වන විට රු.මි. 8.27 ක් වැයකර ආනයනය කරවා ගෙන තිබුනි. දුම්රිය එන්ජින්වල යාන්ත්‍රික උපාංගවලට අදාළ වගකීම් කාලය 2022 අගෝස්තු 28 දින ට ඉකුත්ව තිබූ අතර ආනයනය කර වසර 02ක් ගතවී පැවතියද අපේක්ෂිත කාර්යය සඳහා යොදවා ගත නොහැකිව දුම්රිය දෙපාර්තමේන්තුවේ අංගනවල ගාල් කර තිබුණු අතර එක් දුම්රිය එන්ජිමක අමතර කොටස් M/S Donfang Electricals International Corporation ආයතනයේ දේශීය නියෝජිත ආයතනය විසින් ගලවා වෙනත් දුම්රිය එන්ජිමකට සවිකර තිබූ බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් විසින් 2020 සැප්තැම්බර් 18 දිනැති ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් වෙත යවන ලද ලිපිය අනුව කොළඹ අගනගර ආශ්‍රිත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන තෙක් ඉහත දුම්රිය එන්ජින් 4 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට ප්‍රයෝජනයට ගැනීමට අවසර ලබා දී ඇත. | අදාල අරමුණ කරා යාමට කටයුතු කලයුතුය. |
| (iii) | අරුවක්කාලු සනීපාරක්ෂක කසල රැඳවුම් ව්‍යාපෘතිය සඳහා බහාලුම් පෙට්ටි 94 ක් මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තුවට අනුව 2020 වර්ෂය අවසානයේදී බහාලුම් පෙට්ටි 94 ලැබීමට නියමිතව තිබුණද ඒවා සැපයූ පසු එම පෙට්ටි රඳවා තබා ගැනීමට සුදුසු ස්ථානයක් වෙන්කරගෙන නොමැති බැවින් ඒවා සැපයීම 2022 අප්‍රේල් 30 වන දින දක්වා ප්‍රමාදවී සිදුවී ඇති අතර ගිවිසුම් ගත කාලයට වඩා මාස 16 කින් ප්‍රමාද වී තිබුණි. | 2020 අගෝස්තු 23 වන විට අදාළ ප්‍රසම්පාදනය නිම කල යුතුය. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021 නොවැම්බර් 11 දින පැවති ස්ථාවර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවේ ලද අනුමැතියට අනුව අදාල ණයවර ලිපියෙහි දිගුව 2022 අප්‍රේල් 30 වන දින තෙක් දීර්ඝ කරන ලද අතර 2022 අප්‍රේල් 30 වන දින අදාළ බහාලුම් පෙට්ටි 94 මෙරටට ගෙන එන ලදී. | වියදම් අවම වන ආකාරයට කටයුතු කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | අරුවක්කාලු සනීපාරක්ෂක කසල රැඳවුම් ස්ථානයේ සැලසුම් වලට අනුව වැසිජලය පිටතට ගලායාම සඳහා සකස් කරතිබූ කොන්ක්‍රීට් කාණු පද්ධතිය ඉදිකර ඉදිරියේදී ඇතිවිය හැකි ගං වතුර ආපදා තත්වයන්ට මුහුණ දීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. එම නිසා 2021 නොවැම්බර් 09 කසල රැඳවුම් අංගනය ගංවතුරෙන් යට වී යන්ත්‍රෝපකරණ අක්‍රීය තත්වයට පත් වී තිබූ අතර, එම අවස්ථාව වනවිටත් ඉදිකිරීම් නිත්‍යානුකූලව පවරාගෙන නොතිබුණු අතර අලාභහානිය 2022 ඔක්තෝබර් 31 වන විටත් කොන්ත්‍රාත්කරු විසින් යථා තත්වයට පත්කර නොතිබුණි. | නිරීක්ෂණ හා එකඟ වේ. වැසි ජලය ගලා යාමට විකල්ප ක්‍රම වේදයන් සෙවීම සඳහා මේ වන විට වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය සභාවේ සභාපති හා මධ්‍යම පරිසර අධිකාරිය එක්ව කටයුතු කරනු ලැබේ. අපදියර ප්‍රතිකර්ම පද්ධතියට හා රසායනාගාරයට සිදු වූ හානිය ප්‍රතිපූර්ණය කිරීම මේ වන විට China Harbour Engineering Co. Ltd. අරඹා ඇති අතර අලුත්වැඩියා කල හැකි උපකරණ අලුත්වැඩියා කිරීමටත් ඉතිරි උපකරණ සියල්ල අලුතින් ලබා දීමත් ඔවුන්ගේ රක්ෂණ මුදලින් සිදු කරනු ලැබේ. | ආපදා තත්වයන් පිළිබඳ සැලකිළිමත් විය යුතු අතර රාජ්‍ය දේපල ආරක්ෂා වන අන්දමින් කටයුතු කල යුතුය. |
| (v) | ශ්‍රී ලංකාවේ ප්‍රථම අපදියර ප්‍රතිකර්ම පද්ධතියකින් සැදුම්ලත් ව්‍යාපෘතියක් වන බැවින් කොන්ත්‍රාත් සමාගම විසින් පරීක්ෂණ 01 (test 01) සිදුකිරීමත් සමඟ ඒ සඳහා දේශීය විශේෂඥවරුන්හට මෙම තාක්‍ෂණය පිලිබඳ පුහුණුවක් ලබා දීමත්, අවශ්‍ය කාර්‍යය මණ්ඩලය බඳවා ගැනීමත් සිදු කර නොතිබුණු අතර විගණනය සිදුකරන ලද 2022 මාර්තු 31 දින තෙක්ම ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ කරද නොතිබුණි. | අපදියර පිරිපහදු කිරීමට අමතරව දේශීය විශේෂඥවරුන් සඳහා මෙම තාක්‍ෂණය පිලිබඳ පුහුණුවක් ලබා දීමට අනුමත ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ සිටින ජ්‍යේෂ්ඨ තනතුරු සඳහා පුවත්පත් දැන්වීම් පළකලද ඒ සඳහා සුදුසුකම් ඇති පුද්ගලයන් බඳවාගෙන නොතිබුණි. කෙසේ වෙතත් අරුවක්කාලු සහ කැලණිය කසල හුවමාරු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු නිම නොකිරීමෙන් ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට හැකියාවක් නොමැත. | සැලසුම් කල පරිදි නියමිත කාලසීමාව තුල අදාල ඉලක්ක සපුරාගෙන ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ කලයුතුය. |
| (ඇ) | **කොල්ලුපිටිය සිට දෙහිවල ඇල දක්වා යෝජිත විනෝදාස්වාද මුහුදු වෙරළ තීරය නිර්මාණය කිරීම.** | | |
| (i) | කොල්ලුපිටිය සිට දෙහිවල ඇල දක්වා යෝජිත විනෝදාස්වාද මුහුදු වෙරළ තීරය නිර්මාණය කිරීම 2017 අප්‍රේල් 30 දින ආරම්භ කර 2023 දෙසැම්බර් 31 දින නිම කිරීමට සැලසුම් කර තිබූ අතර මේ සඳහා ඇස්තමේන්තුගත වියදම රු.මි.1820.78 ක් වි ය. ව්‍යාපෘති සක්‍යතා අධ්‍යයන වාර්තාව හා පාරිසරික බලපෑම් | පිළිතුරු ලබා දීමට කල් ඉල්ලා තිබුණි. | සැලසුමට අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදුකරන අතරතුර රාජ්‍ය මුදල් වැය කිරීමේදී |

| | | | |
|---|---|---|---|
| | වාර්තාව 2020 දෙසැම්බර් 31 වන විට අවසන් කර තිබූ අතර මේ සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිත ආයතනය (NARA) වෙත රු.මි.117.86 ක් ගෙවා තිබුණි. අමාත්‍යාංශ ව්‍යාපෘති ඒකකය 2020 ඔක්තෝම්බර් 20 දින වැසීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ නාගරික සංවර්ධන අධිකාරියට පවරා තිබූ අතර මෙතෙක් ඉදිරි කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | | අපේක්ෂිත ඉලක්ක ලගා කිරීමට කටයුතු කලයුතුය. |
| (ii) | මෙම ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කරගැනීමේදී සංවර්ධනයන් සිදුකරන ප්‍රදේශයන් තුල පදිංචි පවුල් 54ක් සඳහා නැවත ස්ථාන ගත කිරීම උදෙසා නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිවාස ලබා දී තිබු අතර පදිංචි කරුවන් 35 දෙනෙකු පමණක් මෙම නිවාස වල පදිංචි වී තිබුණි. මේ සඳහා රු.මි.40.42 ක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට රු.මි.90 ක් බැරකම් යටතේ දක්වා තිබුණි. | පිළිතුරු ලබා දීමට කල් ඉල්ලා තිබුණි. | ඉඩම් අත්කර ගැනීම හා ස්ථානගත කිරීම සම්බන්ධ ගැටළු විසදාගත යුතුය. |
| (iii) | ව්‍යාපෘති කාර්යාලය පවත්වාගෙන යාම සඳහා 2017 සිට 2020 දක්වා රු.මි.99.37 ක් වැයකර තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 47 ක්ව පැවතුණි. | පිළිතුරු ලබා දීමට කල් ඉල්ලා තිබුණි. | සැලසුම් කල පරිදි ව්‍යාපෘති නිම කිරීම හා අපේක්ෂිත ඉලක්ක ලගා කරගත යුතුය. |

## 3.8 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

අමාත්‍යාංශය වෙත නිකුත් කරන ලද පහත විස්තර සඳහන් විගණන විමසුම් සඳහා 2022 ඔක්තෝබර් 31 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි.

| | **විගණන විමසුම පිළිබඳ විස්තරය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | බස්නාහිර කලාපීය තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රවහන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | ඡේදය සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |